ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2008 අංක 3 දරන රාජ්‍ය සේවා බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ජනවාරි මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2008 ජනවාරි මස 25 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු.5.00 යි.

## 2008 අංක 3 දරන රාජ්‍ය සේවා බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 2008 ජනවාරි මස 23 වන දින]**

එල්. ඩී. -ඕ.(අයිඑන්සී.) 33/2005

රාජ්‍ය සේවා බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම පිණිස වූ පනතකි.

පූර්විකාව.

"රාජ්‍ය සේවා බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සංගමයක් එහි සාමාජිකයන් එක්ව වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 3 දරන රාජ්‍ය සේවා බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා බෞද්ධ සංගමයේ දැනට සාමාජිකයන් වන තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "රාජ්‍ය සේවා බෞද්ධ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය භාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. රාජ්‍ය සේවා බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(1) රාජ්‍ය සේවයේහි සේවා නියුක්ත සහ සේවා නියුක්තව සිටි බෞද්ධයන්ගේ—

(අ) ආගමික, සාමාජික, සංස්කෘතික හා අධ්‍යාපනික අවශ්‍යතාවන් ඉටු කිරීමට පියවර ගැනීම ;

(ආ) අන්‍යොන්‍ය සම්බන්ධතාවය ඇති කිරීම සහ වැඩි දියුණු කිරීම ;

(ඇ) අධ්‍යාත්මික වර්ධනය ඇති කිරීම සහ පෝෂණය කිරීම ;

(ඈ) අවංකභාවය, කාර්යක්ෂමතාවය, අපක්ෂපාතීත්වය, මහා මහජන සම්බන්ධතාවය වැනි සාරධර්ම ප්‍රගුණ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(2) බෞද්ධ සමාජයට බලපාන කාරණා සම්බන්ධයෙන් හැකිතාක් දුරට සුදුසු පියවර ගැනීම ;

(3) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ දරන වෙනත් සමාගම් සමග සහයෝගයෙන් වැඩ කිරීම ; සහ

(4) පොදුවේ බෞද්ධයන්ගේ සුභසිද්ධිය උදෙසා කටයුතු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ අවසන් කිරීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් සහ වෙනත් ආධාර භාරගැනීමේ හෝ එකතු කිරීමේ ද, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ පහ කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම සඳහා, අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා කාරණා හා දේ කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරාපත් කර ගනු ලබන ධුර දරන්නන්ගෙන් ද වෙනත් යම් සාමාජිකයන්ගෙන් ද සමන්විත වූ (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් හෝ සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) ධූර දරන්නන් පත් කර ගැනීම, ඉල්ලා අස්වීම, ධූර අත්හැරීම හෝ ඔවුන් ධූරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් තෝරාපත් කර ගැනීම, මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඉල්ලාඅස්වීම, සාමාජිකත්වයෙන් ඉවත්වීම හෝ ඔවුන් සාමාජික ධූරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) මණ්ඩලයේ රැස්වීම්වල දී, ඒ රැස්වීම කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ නිවේදන සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ; සහ

(උ) සමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම එවැනි ම රැස්වීමකදී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු තියාදන, ප්‍රදාන, පරිත්‍යාග, හෝ දායක මුදල් වශයෙන් ලැබෙන සියලු මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි යම් එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද සියලු වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

8. (1) සංස්ථාව විසින් එයට ලැබුණු සහ වියදම් කළ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කර විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයකු හෝ විගණකවරුන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

9. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට සංගමයට අයවිය යුතු හෝ ගෙවිය යුතු හෝ සියලුම ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් ද මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

10. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු තියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, නීතියෙන් සංස්ථාවට හැකියාව හා බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් තියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ රීතිවලට යටත්ව, ඒ සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය

11. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූද ස්වකීය රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් සංගමයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය කවරේදැයි, සංස්ථාවේ සාමාජිකයන් විසින්, සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම තීරණය කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

12. සංස්ථාවේ කිසිම සාමාජිකයකු, සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික ගාස්තුවල ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය. සංස්ථාවේ බැරකම් සීමාකිරීම

13. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ගරු ප්‍රධාන ලේකම්වරයාගේ භාරයේ තබා ගත යුතු ය. ගරු ප්‍රධාන ලේකම් සහ සභාපතිවරයා හෝ ගරු භාණ්ඩාගාරිකවරයා යන දෙදෙනාගෙන් කෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

14. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ සහ අනෙකුත් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි (විදේශීය) රු. 1.160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.